මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை.
The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No.: PE/COP/POLI/Circulars | ඔබේ අංකය / உமது இல. / Your No.: | දිනය / திகதி / Date: 11 .12.2025 |

රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 05/2022 (iii)

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල සභාපතිවරුන්,

<u>ජ්‍යෙෂ්ඨත්වයට හානියක් නොවන පරිදි රාජ්‍ය ව්‍යවසායයන්හි නිලධාරීන්ට විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2022.08.22 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 05/2022, 2023.05.17 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 05/2022 (i), 2023.07.28 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 05/2022 (ii) කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

2. ඒ අනුව, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් 2025.12.05 දින නිකුත් කරන ලද අංක 14/2022 (V) දරන චක්‍රලේඛයේ ප්‍රතිපාදනවලට සමගාමීව රාජ්‍ය ව්‍යවසායයන්හි සේවකයින් සඳහා විදේශීය වැටුප් රහිත නිවාඩු අනුමත කිරීම පහත සඳහන් විධිවිධානයන්ට යටත්ව වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවීමට තීරණය කෙරේ.

2.1 දැනට 2022.08.22 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 05/2022 හා ඊට අනුෂංගික චක්‍රලේඛ විධිවිධාන අනුව විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා සිටින නිලධරයන් සඳහා දැනට අනුමත කර ඇති නිවාඩු කාලසීමාවට පමණක් අදාළ වන පරිදි එම නිවාඩුව ලබා ගැනීමට අවස්ථාව ලබා දිය යුතුය.

2.2 දැනට විදේශීය වැටුප් රහිත නිවාඩු අනුමැතිය ලබා එම නිවාඩුව ගත කිරීමට අපේක්ෂාවෙන් සිටින නිලධරයන්ට ඉහත චක්‍රලේඛ විධිවිධාන අනුව දැනට අනුමත කර ඇති කාලසීමාවට අදාළ වන පරිදි පමණක් එම නිවාඩුව ලබා ගැනීමට අවස්ථාව ලබා දිය යුතුය.

2.3 2022.08.22 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 05/2022 හි 3.4 වගන්තියෙහි සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මේ වන විට ලබා දී ඇති නව නිවාඩු අයදුම්පත්‍ර/ නිවාඩු දීර්ඝ කිරීමේ අයදුම්පත්‍ර සඳහා නිවාඩු අනුමත කිරීම සහ නිවාඩු දීර්ඝ කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එකඟතාවය ලබා දීමේ කටයුතු 2025.12.31 දිනට පෙර අවසන් කළ යුතුය.

2.4 නව නිවාඩු අයදුම්පත්‍ර හෝ නිවාඩු දීර්ඝ කිරීමේ අයදුම්පත්‍ර භාර ගැනීම වහාම ක්‍රියාත්මක වන පරිදි නතර කළ යුතු අතර, 2026.01.01 දිනෙන් පසු 2022.08.22 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 05/2022 හා ඊට අනුෂංගික චක්‍රලේඛ විධිවිධාන අනුව රජය සතු ව්‍යවසායයන්හි නිලධරයන්ට නිවාඩු අනුමත කිරීම සිදු නොකළ යුතුය.

3. මෙම චක්‍රලේඛ විධිවිධාන සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වුවහොත් ඒ සම්බන්ධයෙන් දුරකථන අංක 011-2484627 මඟින් රාජ්‍ය ව්‍යාපාර අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වෙතින් විමසිය යුතුය.

ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම

භාණ්ඩාගාර ලේකම්

පිටපත්: 1. ජනාධිපති ලේකම්

2. අග්‍රාමාත්‍ය ලේකම්

3. අමාත්‍ය මණ්ඩල ලේකම්

4. විගණකාධිපති